### පළාත් පාලන ඡන්ද විමසීම 2018

| | |
|---|---|
| දේශපාලන පක්ෂය - ඒ | ✳ |
| දේශපාලන පක්ෂය - බී | ✳ |
| දේශපාලන පක්ෂය - සී | ✳ |
| ස්වාධීන කණ්ඩායම් අංක 1 | ✳✳ |
| ස්වාධීන කණ්ඩායම් අංක 2 | ✳ |

මෙම ඡන්දදායකයන් දැනුම්වත් කිරීම සඳහා සකස් කරන ලද ආදර්ශ ඡන්ද පත්‍රිකාවක් මිස නිල ඡන්ද පත්‍රිකාවක් නොවේ.

## ප්‍රජාතන්ත්‍රවාදී පාලනය :

"තමන්ට ම අයිති නිදහස් ලෙස තෝරා ගැනුණු තමාගේ නියෝජිතයන් මගින් හෝ සිය රටේ රාජ්‍ය පාලනයට සහභාගීවීමේ අයිතිය හැමදෙනාටම ඇත"

*මානව අයිතිවාසිකම් ප්‍රකාශනයේ 21 වැනි වගන්තිය.*

**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ පණිවුඩයකි.**

---

සම්පාදනය: **මංජුල ගජනායක**
ජාතික සම්බන්ධිකාරක, CMEV

ඡායාරූප උපුටා ගැනීම අන්තර්ජාලයෙනි.
සංකේත උපුටා ගැනීම මැතිවරණ කොමිෂන් සභාවේ ආදර්ශ ඡන්ද පත්‍රිකාවෙනි.

CENTRE FOR MONITORING ELECTION VIOLENCE
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்



# ඡන්දෙන් පටන්ගමු

## ඔබ ඔබේ ඡන්දය භාවිත කළ යුත්තේ කෙසේ ද? :

- ඔබ සතුව ඇත්තේ එක් ඡන්දයකි
- අදාළ දේශපාලන පක්ෂය/ස්වාධීන කණ්ඩායමේ නම සහ නිල සළකුණ ඉදිරියේ ඇති කොටුව තුළ ඔබගේ කැමැත්ත (X) සටහන් කරන්න. මෙවර මනාප සළකුණු කිරීමක් අවශ්‍ය නැත
- ඡන්ද පත්‍රිකාවේ අපේක්ෂකයාගේ/අපේක්ෂකයන්ගේ නම් සටහන් වී නැත. එය ඡන්ද මධ්‍යස්ථාන භූමිය තුළ හොඳින් පෙනෙන තැනක ප්‍රදර්ශනය කර ඇත
- නියමිත කොටුව සම්පූර්ණ වන පරිදි කතිර (X) සළකුණ යොදන්න
- සම්පූර්ණ නොකළ (X) කතිර සළකුණු හෝ නියමිත කොටුවෙන් පිටත සටහන් කරන (X) කතිර සළකුණු අවලංගු වූ ඡන්ද ලෙස සැළකීමට ඉඩ ඇත.

VOTE

# ඡන්දය ඔබේ බලයයි !



## පුංචි ආණ්ඩුව :

පළාත් පාලනය යනු ශ්‍රී ලාංකීය අපට ආගන්තුක විෂයක් නොවේ. සියවස් ගණනාවක ඉතිහාසයක් සහිත පළාත් පාලනයේ වර්තමාන ස්වරූපය මෙලෙසය.

| | |
|---|---|
| මහනගර සභා | 24 |
| නගර සභා | 41 |
| ප්‍රාදේශීය සභා | 276 |

කවර ආකාරයේ පරිපාලන හෝ දේශපාලන ව්‍යුහයක් රටේ පැවතිය ද අදටත් ශ්‍රී ලාංකීය අපට වඩාත් සමීප පාලන ඒකකය වී ඇත්තේ පළාත් පාලන ආයතනය හෙවත් පුංචි ආණ්ඩුවයි. එවන් පුංචි ආණ්ඩු 341 ක් දැනට ස්ථාපිතව ඇත.




## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම හෙවත් පුංචි ආණ්ඩු ඡන්දය :

"මැතිවරණය යනු ප්‍රජාතන්ත්‍රවාදයේ මහෝත්සවය" යැයි පවසන්නේය. ඒ අනුව ඡන්දය යනු ඔබගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය උරගා බැලෙන මාහැඟි අවස්ථාවයි. එය පුරවැසි ඔබ සතු ආභරණයක් පමණක් නොවේ. එය ඔබේ හඬයි.

ඔබ ඔබේ කැමැත්ත හෙවත් ඡන්දය ප්‍රකාශ නොකරන විටෙක දී සිදු වන්නේ නුසුදුස්සන් පෙරට ඒම මිස වෙන අන් යමක් නොවේ. **"නායකයන් තෝරා ගැනීමට ඔබ දක්වන උනන්දුව තුළින් තහවුරු වන්නේ ඔබට, ඔබට ම අනන්‍ය වූ නිසි වටිනාකමක් ඇති බව යැයි"** ලින්ඩා චාවේස් නම් සිවිල් සමාජ ක්‍රියාකාරිනිය පවසා ඇත්තේ එබැවිනි.

## අලුත් මැතිවරණ ක්‍රමයේ සාක්ෂිකරුවෙක් වන්න :

මෙවර අප සතුව ඇත්තේ නව මැතිවරණ ක්‍රමයකි. පෙබරවාරි මස 10 වැනි දින උදෑසන ම ඔබගේ ඡන්ද මධ්‍යස්ථානයට ගොස් ඡන්දය භාවිත කිරීමෙන් මෙම අලුත් මැතිවරණ ක්‍රමයේ සාක්ෂිකරුවෙක් වීමට ඔබට හැකිය.

මනාප ක්‍රමය පිටුදැක ගමට හෝ නගරයට වගකියන නියෝජිතයෙක් ඉල්ලා ශ්‍රී ලාංකීය පුරවැසියා කාලාන්තරයක් හඬ නැගුවේය. එළඹෙන පෙබරවාරි මස 10 වැනිදායින් පසු මෙරටේ කුඩා ම දේශපාලන ඒකකය වන්නේ කොට්ඨාශයයි.

එය කේවල (එක් සභිකයෙක් සහිත) හෝ බහු (සභිකයන් දෙදෙනෙක් හෝ තිදෙනෙක් සහිත) කොට්ඨාශ වලින් සමන්විත වන්නේය. ඒ අනුව මෙතැන් පටන් ශ්‍රී ලංකාවේ කුඩාම දේශපාලන ඒකකය වන්නේ එලෙස ස්ථාපිත කොට්ඨාශයයි. තවද මෙරටේ කුඩාම පරිපාලන ඒකකය වන්නේ ග්‍රාම නිලධාරි වසමයි.

කවර දේශපාලන හෝ පරිපාලනමය අභියෝග පැවතිය ද අපගේ ඒකායන උත්සාහය විය යුත්තේ ගමත් නගරයත් බැබලවිය හැකි, පිරිසිදු දේශපාලනය අනුදත් නියෝජිතයෙක් තෝරා ගැනීමයි. **ඔබගේ අසල්වැසියා එකී නියෝජිතයා තෝරා දෙන තෙක් නොසිට, පෙරට ඒමේ වගකීම ඔබ සතුය.**

ඡන්දය යනු වෙන අන් කවරක් හෝ නොවේ. ඔබ සතු නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතියයි. එය නිසි ලෙස භාවිත කිරීම පුරවැසි ඔබේ වගකීමයි, යුතුකමයි.

කෘතහස්ත දේශපාලනඥයෙකු වූ වින්ස්ටන් චර්චිල් "පුංචි මිනිසාගේ බලය" ගැන මෙලෙස හඬ නැගුවේය.

"ප්‍රජාතන්ත්‍රවාදයට පිදෙන සෑම උපහාරයකම මූලය ඇත්තේ පුංචි මිනිසෙක්, පුංචි පැන්සලක් අතැතිව, පුංචි කුටියක් තුළට ගොස්, පුංචි කඩදාසි කැබැල්ලක සලකුණු කරන, පුංචි කතිරය මතයි. අන් කවර හෝ සංකථනයක්, විවරණයක් හෝ පෘතුල සංවාදයකින් එම සංකල්පයට ඇති වැදගත්කම කෙරෙහි කිසිදු ආකාරයක බලපෑමක් සිදුකළ නොහැකිය"

## කාන්තා දේශපාලන සහභාගීත්වය තහවුරු කිරීමට ඔබත් සහාය වන්න :

නව මැතිවරණ ක්‍රමය මගින් රටට දායාද කර ඇති තවත් එක් සැබෑ ආයෝජනයක් වන්නේ කාන්තාවන්ගේ දේශපාලන නියෝජනයට අදාළ 25% ක කෝටාවක් ලබාදීමයි. මෙරටේ ඡන්දහිමි නාමලේඛනයේ 52% ක වැඩිම ප්‍රතිශතයක් හිමි පිරිස ද කාන්තාවන් ය. පිරිසිදු දේශපාලන සංස්කෘතියක් උදාකර ගැනීමේ එක් මගක් විය හැක්කේ අවබෝධයක් සහිත සමාජ හා දේශපාලන අත්දැකීමෙන් යුත් කාන්තාවන් සඳහා ද සුදුසු දේශපාලන නියෝජනයක් ලබාදීමයි.

**කාන්තා දේශපාලන නියෝජනයට ආශිර්වාද කිරීම පුරවැසි ඔබ සිදුකරන සමාජ ආයෝජනයකි. ඊට ආශිර්වාද කිරීම ඔබේ වගකීමක් සේ සළකන්න.** අපගේ සමාජය වඩාත් වර්ණවත් වන්නේ ගැහැණු හා පිරිමි දෙපාර්ශවය ම තම වගකීම් හා යුතුකම් එකිනෙකා හා බෙදාහදා ගනිමින් කටයුතු කිරීමෙනි.

## ඡන්දය දීම සඳහා ඡන්ද පොළේ දී අනන්‍යතාව සනාථ කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි :

ඡන්ද පොළේ දී අනන්‍යතාව සනාථ කිරීම සඳහා සෑම ඡන්ද හිමියෙකු විසින් ම පහත සඳහන් හැඳුනුම්පත් අතුරින් එකක් ඡන්ද මධ්‍යස්ථානයේ නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍යය :

# පිරිසිදු දේශපාලන සංස්කෘතියක් උදෙසා
# ඇයට බලය දෙමු !



1. ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය
3. වලංගු රියදුරු බලපත්‍රය
4. රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත (පැරණි හෝ නව ඊ-හැඳුනුම්පත)
5. වැඩිහිටි හැඳුනුම්පත
6. පූජ්‍ය/පූජක හැඳුනුම්පත (පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද)

ඊට අමතරව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද **තාවකාලික හැඳුනුම්පත**